# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1797/18 - 2013 පෙබරවාරි මස 13 වැනි බදාදා - 2013.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/15/40/2010.

**කාර්මික ආරවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වැනි සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.11.14 දිනැති හා අංක 1732/1 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.11.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, මරදාන, මොහිදීන් මස්ජිත් පාර, නො. 130හි පදිංචි ඒ. පී. ප්‍රේමලාල් මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.12.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

*යොමු අංකය :* IR/15/40/2010.

කාර්මික අධිකරණයේදීය

ඒ. පී. ප්‍රේමලාල් මයා,
නො. 130, මොහිදීන් මස්ජිත් පාර,
මරදාන, කොළඹ 10.

බේරුම්කරණ නඩු අංක *:* A 3419

ඉල්ලුම්කරු
සිලොන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්,
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

වගඋත්තරකරු
අතර පවත්නා කාර්මික ආරවුල
සම්බන්ධ

ප්‍රදානයයි.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණි ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 ; 1957 අංක 62 ; 1962 අංක 04 ; සහ 1968 අංක 39 ; (1968 අංක 37 දරණ කාර්මික ආරවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදයේ (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමාට බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් වර්ෂ 2011.11.04 වන දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුලට හේතු වී පවතින්නේ :

"සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් නිකුත් කර ඇති මානව සම්පත් කාර්‍යාංශ චක්‍රලේඛ අංක එච්. ආර්. එෆ්. 024-274 පරිදි ඒ. පී. ප්‍රේමලාල් මහතාට ඉල්ලා ඇති උසස්වීම් ලබාදීම නීත්‍යානුකූල වන්නේද එසේ නීත්‍යානුකූල වන්නේ නම් ඔහුට ලබා දිය හැකි සහන කවරේද යන්නයි."

උක්ත කරුණ සම්බන්ධයෙන් පාර්ශ්වයන් අතර යම් සමථයක් වෙත් දැයි ආරම්භයේදීම විමසන ලදුව එසේ නොවන බව ප්‍රකාශ වූයෙන් විභාගය ආරම්භ කිරීමට නියෝග කරන ලදී.

කාර්මික ආරවුල් පනතේ සම්පාදිත නියෝග සංග්‍රහයේ 21(1) දරණ නියෝගය ප්‍රකාරව දෙපාර්ශ්වයේ සවිස්තර ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කිරීමටත්, එසේ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රති ප්‍රකාශද පාර්ශ්ව අතර හුවමාරු කරවන ලදී.

ඉල්ලුම්කරු වෙනුවෙන් නීති උපදේශක ග්‍රේෂන් ද සිල්වා මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරී අනුරාධා ජයවර්ධන මහත්මිය පෙනී සිටියහ.

පාර්ශ්වයන් අතර සමථයක් නොමැති බැව් පැහැදිලි වීමෙන් අනතුරුව විභාගය සඳහා පියවර ගැනීමේදී පළමුව ඉල්ලුම්කරු සිය නඩුව ඉදිරිපත් කරමින් A 01 දරණ වගඋත්තරකාර ආයතනයේ පිරිස් කළමනාකරුගේ 1995.09.18 දිනැති පත්වීම් ලිපිය ප්‍රකාරව 1996.10.01 සිට ස්ථිර වශයෙන් C 02 ශ්‍රේණියේ රියදුරෙකු ලෙස පත්වීම් ලැබූ ආකාරය හෙළි කළේය. එසේ සිටියදී 1998.09.17 දින වැඩ තහනමකට ලක් වූ බවත්, විධිමත් විනය පරීක්ෂණයෙන් අනතුරුව C02 ශ්‍රේණියේ සිට C 06 ශ්‍රේණිය දක්වා තනතුරෙහි පහත හෙළීමකට හිඟ වැටුප් රහිතව දඬුවමකට භාජනය කළ බැව් A 02 දරණ 2007.03.26 දිනැති ලේඛණය සලකුණු කොට ඉදිරිපත් කළේය. යථෝක්ත දඬුවම සම්බන්ධයෙන් තමා සෑහීමකට පත් නොවූයෙන් ආයතනයේ සභාපතිතුමා වෙත අභියාචනය කිරීම හේතු කොට ගෙන හිඟ වැටුපෙන් 75% තමාට ලැබුණු බවත්, ඊට අදාළ 2007.04.23 දිනැති A 03 වශයෙන් සලකුණු කරන ලද ලේඛණය ඉදිරිපත් කරමින් එකී කාරණය සනාථ කළේය. අනතුරුව තමාට හිඟව පැවති වැටුපේ ඉතිරි 25% සමඟ නැවත පෙර සිට C 02 ශ්‍රේණිය දක්වා සිය තනතුර ඉහළ දැමීමට පියවර ගෙන තිබුණි. C 06 ශ්‍රේණියේ වර්ෂ 3 1/2 ක කාලායක් සේවයේ යෙදෙමින් සිටින අතරතුර නැවත පෙර සිටි C 02 ශ්‍රේණියට ඉල්ලුම්කරු පත්ව ඇත.

2003.02.09 දිනැති A 04 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කළ ලේඛණය මත නැවත C 02 ශ්‍රේණියට උසස් වීම් ලැබූවද එය උසස් වීමක් ලෙස තමා පිළි නොගන්නා බවත් පෙර සිටි ශ්‍රේණියේ තත්වයටම තමා නැවත උසස් වූ බවත් ඉල්ලුම්කරු කියා සිටී. ඒ බව ඉල්ලුම්කරු වැටුප් වර්ධක 15 උපයාගෙන C 02 ශ්‍රේණියේ උපරිමය දක්වා ගමන් කොට සිටි හෙයින් නැවත C 02 ශ්‍රේණිය තමන්ට ලැබුණු උසස් වීමක් නොවන බවත් හෙළි කළේය. වගඋත්තරකාර ආයතනයේ පිළිගත් ප්‍රතිපත්තිය අඛණ්ඩව වැටුප් වර්ධක 10ක් උපයා ගත් සේවකයින්ට උසස් වීමක් ලබා දෙන බවත්, සේවක මණ්ඩල චක්‍ර ලේඛ PF 024/229 හා 2008.02.30 යන A 06 වශයෙන් සලකුණු කරන ලද ලේඛණය අනුව 2008.03.30 දිනට එකම ශ්‍රේණියේ සිටි සේවකයින් හට වැටුප් වර්ධක 10 ලබා ගෙන සිටියේ නම් උසස් වීමක් සඳහා හිමිකම පවතින බවත් හෙළි කළේය. ඒ අනුව ඉල්ලුම්කරුට සී 01 ශ්‍රේණියේ රියදුරු තනතුර ලැබිය යුතු බව ද සාක්ෂාත් කළේය. එම ශ්‍රේණිය තමාට වර්ෂ 2006 සිට ලැබිය යුතු බව ද, මේ වන විට තම වේතනාධික 15 ලබා ඇති බවත් තමාගේ සාක්ෂියේදී A 01 සිට A 09 දක්වා ලේඛණ ඉදිරිපත් කරමින් තමාට අසාධාරණ ලෙස පණවා තිබූ සියළු විනය දඬුවම් ඉවත් කොට ඇති බවත් A 08 හෙවත් H.R.F. 024-274 චක්‍ර ලේඛය අනුව තමාට C 01 ශ්‍රේණියේ උසස් වීම් ලැබිය යුතු බව ද හෙළි කළේය.

A 09 ලේඛණය ආයතනයේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ අමතන ලද කොලොන්නාව මානව සම්පත් කළමණාකරුගේ 2010.02.28 දිනැති සමාංක HRF 103-12446 මගින් 2008 මාර්තු මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ප්‍රේමලාල් මහතා C 01 ශ්‍රේණියට උසස් කරන ලෙස අනුමැතිය ඉල්ලා ඇත.

මෙම කාරණයේදී පැහැදිලි වන ආයතනයේ අහිතකර ක්‍රියාවක් ලෙස හැඳින්විය හැක්කේ විනය විරෝධී කටයුතු කළ සේවක මහතෙකු හට දඬුවම් පැමිණවීම් වස් තමා දරන ලද තනතුරෙන් පහළ හෙළීම නොකළ යුතු ක්‍රියාවක් ලෙසිනි. එසේ පහත හෙළීම ආයතනයේ ඉහළ කළමනාකාරීත්වය පිළිගෙන ඊට ප්‍රතික්‍රියා වශයෙන් හිඟ වැටුප් පවා ගෙවා ඇත. එය යහපත් ක්‍රියාවක් සේ අගය කළ හැකිය.

කෙසේ වෙතත් මෙම කාර්මික ආරවුලට හේතු වූ කරුණ වූයේ වගඋත්තරකාර ආයතනය නිකුත් කරන ලද H.R.F. 024-274 පරිදි A. P. ප්‍රේමලාල් මහතාට ඉල්ලා ඇති උසස් වීම් නීත්‍යානුකූල වන්නේද යන්නයි.

එකී උසස්වීම එනම් C 01 ශ්‍රේණිය සඳහා උසස්වීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් ඔහු විසින් සපුරා තිබීම හේතු කොට ගෙන එකී උසස්වීම ලබා දීම නීත්‍යානුකූල වන්නේය යන්න මම නිගමනය කරමි.

එසේ නීත්‍යානුකූල වන බැවින් ඉල්ලුම්කරු වෙත 2006 වර්ෂයේ සිට C 01 ශ්‍රේණිය සඳහා වූ උසස් වීම හිඟ වැටුප් සහිතව ලබා දීම ප්‍රේමලාල් මහතාට ලබා දිය හැකි සහන ලෙස මම නිර්දේශ කරමි. මෙම ප්‍රදානය සාධාරන හා යුක්ති සහගත බව ප්‍රකාශ කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කාර
මණ්ඩලයේ සාමාජික.

2012 දෙසැම්බර් මස 31 වැනි දින.

03 - 146

*මගේ අංකය :* IR/15/07/2007.

**කාර්මික ආරවුල් පනත 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වැනි සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2009.02.26 දිනැති හා අංක 1590/15 දරණ *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2009.02.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පානදුර, සිරිල් ජැන්ස් මාවත, 'හයිලන්ඩ්ස්', අංක 75හි පදිංචි, ආර්. ඒ. චාන්දනී රණසිංහ මහත්මිය හා අනෙක් පාර්ශවය වශයෙන්, කොළඹ 07, නිදහස් චතුරශ්‍රය, තැ.පෙ. 574 හි පිහිටි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව  අතර පවත්නා කාර්මික ආරවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.12.31 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 ජනවාරි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/15/07/2007.

කාර්මික අධිකරණයේදීය

ආර්. ඒ. චාන්දනී රණසිංහ,
අංක 75, "හයිලන්ඩ්ස්",
සිරිල් ජැන්ස් මාවත,
පානදුර.
ඉල්ලුම්කාරිය

බේරුම්කරණ නඩු අංක : A 3275

එරෙහිව
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව,
තැ.පෙ. 574,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

වගඋත්තරකරු
අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ

ප්‍රදානයයි.

වර්ෂ 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04, සහ 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවෙන අණ පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වැනි පරිච්ඡේදය වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් වර්ෂ 2009.02.19 මා පත් කොට මා වෙත යොමු කර ඇත.

බේරුම්කිරීම සඳහා සැලකිල්ලට ගත යුතුව තිබූ කරුණ වූයේ,

"ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් 1996.03.26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි III වන ශ්‍රේණියේ ලේඛක සහකාර තනතුරට බඳවා ගනු ලැබූ ආර්. ඒ. චාන්දනී රණසිංහ මහත්මිය ඇයගේ මුල් පත් වීමේ දිනය පදනම් කරගෙන ලේඛක සහකාර හෝ පොත් තබන්නා යන තනතුරු දෙකෙන් කුමන තනතුරට පත් කළ යුතු වන්නේද යන්න හා එලෙස තනතුර ලබා දීමේදී ආර්. ඒ. චාන්දනී රණසිංහ මහත්මිය පිහිටුවිය යුතු ශ්‍රේණිය හා වැටුප් තලය කුමක් විය යුතුද යන්න පිළිබඳව වේ යන්නයි."

ඉහත කී ලෙස වූ මෙම ආරවුල බේරුම්කරණයෙන් විසඳීම සඳහා මා වෙත යොමු කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාර හා වගඋත්තරකාර යන දෙපාර්ශ්වයම යථෝක්ත ආරවුල් සම්බන්ධයෙන් තම ප්‍රකාශයන්ද ප්‍රති ප්‍රකාශයන්ද ඉදිරිපත් කළහ. කාර්මික ආරවුල් පණතේ සම්පාදිත නියෝග සංග්‍රහයේ 21(1) දරණ නියෝගය ප්‍රකාර ඉහත කී ප්‍රකාශ දෙපාර්ශවයෙන් අතර හුවමාරු කරවන ලදී.

පවත්නා කාර්මික ආරවුල සම්බන්ධයෙන් කිසියම් සමථයක් වෙත්දැයි දෙපාර්ශ්වයෙන්ම විමසන ලදුව වගඋත්තරකාර පාර්ශ්වයේ ස්ථාවරය වූයේ සමථයක් නොපත්නා බැවින් විභාගය ආරම්භ කළ යුතු බවය. ඒ අනුව ඉල්ලුම්කාරිය වෙනුවෙන් නියෝජිත විල්බට් පෙරේරා මහතාද, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ලක්සිරි හේවගේ මහතා පළමුව පෙනී සිටි අතර පසුව නීතිඥ සාගර කාරියවසම් මහතා පෙනී සිටියහ.

ඉල්ලුම්කාරියගෙන් මූලික ප්‍රශ්න විචසීමේදී ඇය 1993.03.26 දින සංස්ථාවේ ලේඛණ සහායක ලෙස කැලි පදනම මත සේවයට බඳවා ගත් බවත්, පොත් තැබීමේ අංශයෙහි සේවයේ යොදවන ලද බව ද ප්‍රකාශ කළාය. A 01 වශයෙන් මෙම තනතුර ලබා දීමේ ලේඛණ සලකුණු කොට ඉදිරිපත් කළ අතර එකී තනතුර ස්ථිර තනතුරක් බවට පත් කොට ඇති බැව් සනාථ කිරීම සඳහා A 02 ලේඛණය ඉදිරිපත් කළාය. ඉල්ලුම්කාරිය එසේ තනතුර දරමින් සිටින අතරතුර එකී තනතුරින් ඉවත් කිරීමක් හෝ ඉල්ලා අස්කර ගැනීමක් නොමැතිවම වගඋත්තරකාර ආයතනය 2000.04.26 දින II ශ්‍රේණියේ පොත් තබන්නා තනතුර පිරිනමමින් වෙනත් පත් වීමක් තමන් හට පිරිනමන ලද බවද සාක්ෂාත් කළාය. සාක්ෂිකාරිය තමාව මීට පෙර ලේඛක සහායක ලෙස පත්වීම් ලිපියක් මගින් පත්කොට සිටියද 1993.05.26 සිට 2000.04.26 දක්වා පොත් තබන්නා යන තනතුරෙහි සේවය කළ බව දැක්වීය. A 03 වශයෙන් මෙසේ පොත් තබන්නා යන තනතුර ප්‍රදානය කිරීමේ පත්වීම් ලිපිය සලකුනු කොට ඇත.

ලේඛක සහායක ලෙස පත්වීම් ලැබූ ලිපියෙහි "සමාන වගකීමෙන් යුක්ත වන්නේ යයි සංස්ථාව විසින් සලකුනු ලබන්නා වූ සංස්ථාවේ ඕනෑම තනතුරක ඔබ සේවයෙහි යෙදවීමේ අයිතිය සංස්ථාව සතු "වන බවත්" තවද ඔබ වැටුපෙහි කිසිදු වෙනසක් සිදු නොකොට දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමටද ඔබට නියම කළ හැකිය වෙතැයි සඳහන් වූ බවත්, පොත් තබන්නා II ශ්‍රේණිය පත්වීම් ලිපියේ "මෙම පත්වීම භාර ගැනීමට ඔබ එකඟත්වය බල කරන්නේ නම් ඒ බව වහාම ලිඛිතව මා වෙත දැනුම් දිය යුතුය. ඉන් පසුව නව වැටුප් ක්‍රමය මත වැටුප් ගෙවීමට ක්‍රියා කරනු ලැබේ." යනුවෙන් සඳහන් වූ බවද සාක්ෂියේදී අනාවරණය විය.

තවද ඉල්ලුම්කාරියගේ ඒ 4 ලෙස සලකුණු කරන ලද 2000.05.05 දින වගඋත්තරකාර ආයතනයට භාර දෙන ලිපියට අනුව ඇයගේ පොත් තබන්නා තනතුරේ රාජකාරී කිරීමේ සේවා කාලය සැලකිල්ලට ගෙන හිඟ වැටුප රහිතව අවසන් වරට පොත් තබන්නා තනතුර ලබා දුන් දිනයේ සිට පෙරදාතම කොට II ශ්‍රේණියේ පොත් තබන්නා තනතුර ලබා දෙන්නේ නම් එය භාර ගැනීමට කැමති බවද, එසේ කිරීමට නොහැක්කේ නම් III ශ්‍රේණියේ ලේඛක සහකාර වශයෙන් සේවය කිරීමට තමා එකඟ බවද වගඋත්තරකරුවන් වෙත ලියා දන්වූ බවත්, එම ලිපි වගඋත්තරකාර ආයතනයේ ලිපි ගොනුවේ නොපවත්වනා බවත් වගඋත්තරකාර ආයතනය සඳහන් කර ඇත.

කෙසේ වෙතත් ඉහත කී A 04 දරණ ලිපිය අනුව ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් 2007.03.22 දින කම්කරු කොමසාරිස්තුමා වෙත පැමිණිලි කළ බවද ඉල්ලුම්කාරිය සිය සාක්ෂියේදී අනාවරණය කළාය.

ඒ 5 වශයෙන් සලකුණු කරන ලද කම්කරු කොමසාරිස් අමතන ලද ඉල්ලුම්කාරිගේ ලිපියෙහි සවිස්තරව තමාගේ නොවිසඳී ඇති ගැටළු මනාව සඳහන් කර ඇත. එනම් 1993.03.26 සිට ලේඛක

සහායක ලෙස පත්වීම් ලැබුවද, 1996.04.01 සිට එම පත්වීම ස්ථිර කළද 2000.01.01 සිට නැවත පොත් තබන්නා තනතුරටද තමා පත් කළ බවත්, එම තනතුර පෙරදාතම කොට නොතිබූ බවත්, වර්ෂ 2007 වැටුප් සංශෝධනය අනුව තමාගේ වැටුපෙහි විෂමතාවයක් පැවති බවත් එය ඉවත් කොට දෙන ලෙසත් සවිස්තර ලෙස සඳහන් කර ඇත.

ඒ 6 යන ලේඛනය සැලකිල්ලට භාජනය කරන ලද කම්කරු කොමසාරිස්තුමා ඒ 7 වශයෙන් සලකුණු කරන ලද ලිපිය වගඋත්තරකාර ආයතනය වෙත යොමු කොට ඇත. ඒ අනුව කම්කරු කොමසාරිස්තුමාගේ තීරණය පහත පරිදි වේ. එනම්,

(i) 1996.03.26 දින ලේඛක සහාකාර III ශ්‍රේණියට පත්වීම ඉල්ලුම්කාරිය ලත් බව ;

(ii) ඇයගේ පූර්ව සේවා කාලය නොසලකා නැවතත් 2000.01.01 සිට පොත් තබන්නා II ශ්‍රේණියට වගඋත්තරකාර ආයතනය පත් කළ බව ;

(iii) ඉල්ලුම්කාරියගේ මුල් පත්වීම පරිදි සේවයේ නොයොදවා දෙවන පත් වීම අනුව වගඋත්තරකරුවන් ක්‍රියා කිරීමෙන් වැටුප් විෂමතාවයක් මෙන්ම උසස්වීම් අවස්ථාවටද මග හැරී ඇති බව ;

(iv) වගඋත්තරකාර පාර්ශ්වයේ 2006 වැටුප් ප්‍රතිශෝධනය මත ලේඛක සහායක II ශ්‍රේණියේ වැටුප පොත් තබන්නා II ශ්‍රේණියේ වැටුපට වඩා වැඩි බව ;

(v) ඉල්ලුම්කාරියට නියමිත තනතුර වන (එනම් මුල් පත්වීම් ලිපිය ප්‍රකාරව) ලේඛක සහකාර III ශ්‍රේණියට පත් වූ 1996.03.26 දින පදනම් කොට ගෙන ඇයට හිමි තනතුර වන ලේඛක සහකාර තනතුරේ නියමිත ශ්‍රේණියේ පිහිටු වීමත්, එකී කාලය සඳහා යම් හිඟ වැටුපක් ඇතොත් එයද ගෙවිය යුතු බව ;

(vi) ඉල්ලුම්කාරිය හා එකට පත්වීම් ලද වෙනත් ලේඛක සහායක තනතුර දරණ වෙනත් අය අතර වැටුප් තලයන්හි විෂමතාවයක් පවත්නා බව ආදියයි.

කම්කරු කොමසාරිස්තුමාගේ ඉහත සඳහන් විසඳුම් වගඋත්තරකාර පාර්ශ්වය පිළිගත් බවත් නොපෙනේ. එහෙත් ගුවන් විදුලි අධ්‍යක්ෂ ජනරාල් (පාලන)ගේ 2007.05.10 දිනැති අධ්‍යක්ෂ (දෙමළ) අමතන ලද ලිපිය, එනම් ඒ 11 අනුව ඉල්ලුම්කාරියගේ උසස්වීම නිර්දේශ කොට ඇති බව පැහැදිලිය. තවද ඒ 14 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රය අනුව චාන්දනී මහත්මියගේ පොත් තබන්නා තනතුර පසුදාතම කිරීම සඳහා තීරණය වී ඇත.

ඉල්ලුම්කාර පාර්ශ්වයේ නඩුව අවසන් කළ පසු වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ වැඩ බලව අධ්‍යක්ෂ (පිරිස්) නිමල් ආරියසේන මහතා සාක්ෂි දුනි. මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න ආදියට ඔහු මෙන්ම ඉල්ලුම්කාරියද මුහුණ දුන්හ.

වගඋත්තරකාර පාර්ශ්වය ආර් 1 සිට ආර් 08 දක්වා ලේඛණ සලකුණු කරමින්ද ඉල්ලුම්කාර පාර්ශ්වය ඒ 1 සිට ඒ 14 දක්වා ලේඛණ සලකුණු කරමින් ද සිය නඩු අවසන් කළහ.

ඉල්ලුම්කාරිය A 09 ලේඛණය අනුව ලේඛක සහායක හා ලේකම් තනතුරෙහි රාජකාරී දැරූ බව පැහැදිලි වේ.

වගඋත්තරකාර ආයතනය මෙම බේරුම්කරණ විභාගයේ ඉල්ලුම්කාරිය හට ලබා දුන් මුල් පත්වීම අනුව ඇය 1996.03.26 දින සිට ලේඛක සහායක III ශ්‍රේණියට පත් කළ බවත්, ඊට අදාල වැටුප් පියවර සහිතව අර්ථසාධක අරමුදල් කොන්දේසිද සමඟ 1996.04.17 දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා අධ්‍යක්ෂ ජනරාල් විසින් විධිමත් පත් වීමක් ලබා දී ඇති බව ද පෙනේ. එම පත්වීම් ලිපියෙහි සේවා නියමයන් හා සේවා කොන්දේසි දක්වා ඇත. එය විධිමත් පත්වීම් ලිපියක් බව පිළිගත හැක.

එය එසේ තිබියදී 2000.04.26 දිනැති ගුවන් විදුලි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පාලනගේ "අංක පා/ජුලි 737/මා 3 දරණ වෙනත් පත්වීම් ලිපියක් මගින් නි.අ.ජෙ. මුදල් මගින්, III ශ්‍රේණියේ ලේඛක සහායක ආර්.ජී.සී. රණසිංහ මිය" අමතන ලද ලිපියකින් නැවත II ශ්‍රේණියේ පොත් තබන්නා තනතුරට පත්කොට ඇත. එකී ඒ 3 වශයෙන් සලකුණු කොටඇති ලේඛනයේ (1) වැටුප් ක්‍රමය, (II) ඊළඟ වේතනාධික දිනය සහ වෙනත් කොන්දේසි අන්තර්ගතව ඇත. තවද එහි "ඔබ මෙම සංස්ථා සේවයට පත් කරමින් නිකුත් කරන ලද මගේ සමාංක හා 1997.09.01 දිනැති පත්වීම් ලිපියේ සඳහන් අනෙකුත් කොන්දේසි හා වරින් වර නිකුත් කරන ලද/නිකුත් කරනු ලබන අනෙකුත් කොන්දේසි වලට යටත්ව නොවෙනස්ව පවතී." යන කොනදේසියක් වේ. ඉන් ගම්‍ය වන්නේ කුමක්දැයි අපැහැදිලිය. මුල් විධිමත් ලිපියක් මගින් විධිමත් පත්වීමක් ලබා තිබියදී තවත් පත්වීම් ලිපියකින් වෙනත් තනතුරකට පත් කිරීම උසස් වීමක් ලෙස සඳහනක්ද නැත. අවස්ථා දෙකෙහිදීම එක් අයෙකු තනතුරු දෙකකට පත් කොට ඇත. එකම ආයතනයේ එසේ සිදු කිරීමට ඉඩක් වනුයේ මුල් පත්වීම් ලිපිය එක්කෝ ඉල්ලා අස් කරගත් පසුය. එසේ නොමැති වීමෙන් ගම්‍ය වනුයේ මුල් පත්වීම එසේම පවත්නා බවත්, දෙවන පත්වීම උසස් වීමක් සහිත තනතුරක් නොවන්නේ නම් හා මුල් පත්වීම ඉවත් කර නොගන්නේ නම් මුල් පත්වීම බලාත්මක බව වේ. දෙවන වර කරන ලද පත්වීම ආයතනයක පරිචයට පටහැනි විය හැක. වැරදීමකින් දෙවන පත්වීම සිදු වූ බවට පිළිගත නොහැක්කේ දෙවන පත්වීම් ලිපියෙහි ශීර්ෂයෙහි මුල් පත්වීම පිළිබඳව සඳහන්ව තිබීමය. කෙසේ වෙතත් පරිපාලන දෝෂයකින් දෙවන පත්වීම් ලිපිය නිකුත් වී ඇතැයි මදකට සිතතොත් පළමු පත්වීම් ලිපිය මේ දක්වා බලාත්මක බව මාගේ නිගමනයයි.

කෙසේ වෙතත් වගඋත්තරකාර ආයතනයේ පාලන අධ්‍යක්ෂවරයාගේ සාක්ෂියෙන් තහවුරු වූයේ ඉල්ලුම්කාරිය පොත් තබන්නා තනතුර භාර ගැනීම ලිඛිතව සිදු නොකළ බවය. එහෙත් කිසිදු විරෝධයකින් තොරව එම තනතුරේ රාජකාරී කරගෙන ගිය බවත් සඳහන් කොට ඇත.

ඉල්ලුම්කාරිය ලේඛක සහායක තනතුර පත්වීම් ලිපි මගින් භාර ගත්තද දිගු කාලයක් පොත් තබන්නා තනතුරෙහි සේවය ආවරණය කිරීම හේතුකොට ගෙන වගඋත්තරකරුවන් පොත් තබන්නා තනතුර පිරි නැමීමට උපේක්ෂා සහගත වී යැයි සිතීමටද හැක.

කෙසේ වෙතත් ඉල්ලුම්කාරියගේ මුල් පත්වීම් ලිපිය ප්‍රකාර ඇය ලේඛක සහායක III තනතුර භාරගෙන ඇත. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් 1996.03.26 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි III

වන ශ්‍රේණියේ ලේඛක සහකාර තනතුරට බඳවා ගනු ලැබූ ආර්. ඒ. චාන්දනී රණසිංහ මහත්මිය ඇයගේ මුල් පත්වීම් දිනය පදනම් කරගෙන ලේඛක සහකාර තනතුරට පත් කළ යුතු වන්නේ යයි විභාගයේදී හෙළි කරගත් කරුණු මත නිගමනය කරමි.

ඉල්ලුම්කාරිය මුල් පත්වීම ලබා දුන් දින සිට එකී නතුරේ සේවය කළේ යැයි උපකල්පනය මත ඇය 2008.04.01 දින වන විට ලේඛක සහායක I ශ්‍රේණිය ලැබීමට සුදුසුකම් සපුරා ඇත. ඒ අනුව 2011.04.01 දින වන විට නියමිත උපරිම වැටුප් තලය ලැබීමටද සුදුසුකම් ලබා ඇත. මේ කරුණු අනුව ඉල්ලුම්කාරිය 1996.03.26 දින පත් වීම ලද III ශ්‍රේණියේ ලේඛක සහායක තනතුරේ අදාල උසස්වීම්, වැටුප් වර්ධක හා ශ්‍රේණිය අද දක්වා ගණනය කොට ගෙවීමටත් නියෝග කරමි. 1996.03.26 දින පත්වීම් දිනය ලෙස සලකා අදාල ශ්‍රේණිය හා වැටුප් තලය තීරනය කිරීම යෙහෙකි. මෙම නිගමනය සාධාරණ හා යුක්ති සහගත වේ. ඉහත තීරනය මේ ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට්පත්‍රයේ පළ වී මසක් තුළ ක්‍රියාත්මක විය යුතු වන්නේය.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කාර
මණ්ඩලයේ සාමාජික.

2012 දෙසැම්බර් මස 31 වැනි දින,

03 - 147

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.